පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.02.18 පැය 0905 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 340 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,
අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,
සියළුම මාධ්‍ය ආයතන.

වැඩ තහනම්ව සිට හෝ සේවය අතහැර ගොස් සිට නැවත සක්‍රීය සේවයට එක්වීමට නියමිත නිලධරයන්, මත්ද්‍රව්‍ය භාවිතය අනාවරණය කර ගැනීමට අදාල පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වීම - පොලිස් මූලස්ථානය.

වැඩතහනම්ව සිට හෝ සේවය අතහැර ගොස් සිට හෝ වෙනත් හේතුවක් මත සක්‍රීය සේවයේ නොසිට නැවත සේවයේ පිහිටුවීමට/නැවත සක්‍රීය සේවයට එක්වීමට නියමිත නිලධරයන් නැවත සේවයේ පිහිටුවීමට/නැවත සක්‍රීය සේවයට එක් කිරීමට පෙර පොලිස් රෝහලේදී මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීමට අදාල පරීක්ෂණයකට පෙනී සිටිය යුතු බවට වැඩබලන පොලිස්පතිතුමා විසින් දිවයිනේ සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු ස්ථානාධිපතිවරුන් වෙත දැනුම් දී ඇත.

කිසියම් නිලධරයෙක් මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බවට වෛද්‍ය වාර්තාවෙන් අනාවරණය වන්නේ නම් එම නිලධාරියා වෙත නැවත සේවය පිහිටුවීම හෝ නැවත සක්‍රීය සේවයට එක්වීමට අවස්ථාව ලබා නොදෙන බව වැඩ බලන පොලිස්පතිතුමා විසින් වැඩිදුරටත් දන්වා ඇත.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.